**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය - 2023**

**---------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2010 අංක 12 දරණ ජාතික ශ්‍රම අධ්‍යයන පනතේ 5 (1) හා (2) වගන්ති | පනතේ විධිවිධාන ප්‍රකාරව ආයතනයේ කටයුතු පරිපාලනය, කළමණාකරණය හා පාලනය ආයතනයේ පාලක සභාව වෙත පැවරී ඇත. ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සඳහා පනත මගින් පාලක සභාව වෙත පැවරී ඇති, නියම වී ඇති හෝ භාරවී ඇති බලතල කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාවේ යෙදවීමට අදාලව, 2022 හා 2023 වර්ෂවල ආයතනයේ පාලක මණ්ඩලය රැස්වී තිබුණේ පිළිවෙලින් එක් වරක් හා දෙවරක් පමණි. | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2022 වර්ෂය සඳහා පත් කර තිබූ පාලක මණ්ඩල සාමාජිකයන් ඉල්ලා අස් වී ඇති බැවින් 2022.06.02 දිනට නව පාලක මණ්ඩලයක් පත් කරදෙන ලෙස හා පාලක මණ්ඩලය සඳහා නිල බලයෙන් පත්වන උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ සාමාජිකයා පත්කර දෙන ලෙස ආයතනය විසින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යංශය වෙත දන්වා යවා ඇත. කරුණු එසේ වුවත් ආයතනයේ පනතෙහි මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූර්ණය සාමාජිකයන් පස්දෙනෙකු විය යුතු බව දක්වා ඇති බැවින් පාලක මණ්ඩල සභාපතිතුමන් හා අනෙකුත් නිල බලයෙන් යුතු සාමාජිකයන් පස්දෙනෙකුගේ ගණ පූර්ණයෙන් යුතුව 2023 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 02ක් පවත්වා ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 16(1) වගන්තිය | පනත යටතේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය තාක්ෂණ කමිටු යම් සංඛ්‍යාවක් මණ්ඩලය විසින් පත්කරනු ලැබිය හැකි වුවද, එවැනි කමිටු පත්කර නොතිබුණි. | පනතේ ඉදිරි අනාගත අවස්ථා හා ආයතනයේ ඉදිරි පුළුල් වීමත් සමඟ සිදු කළ යුතු කරුණු සම්බන්ධයෙන් මෙවන් ප්‍රතිපාදන සලසා දී තිබුණ ද මේ දක්වා එවැනි අවශ්‍යතාවයක් පැන නොනැගී ඇති බැවින් මණ්ඩලය විසින් තාක්ෂණික කමිටු පත් කර නොමැත. ඉදිරි කාලයේ දී ආයතනයේ කටයුතු පුළුල් කිරීමට තරම් වූ මූල්‍ය හැකියාවක් ලද විට අවශ්‍යතාවය මත පාලක මණ්ඩලය විසින් ලබා දෙන උපදෙස් මත පනතේ 16 (i) වගන්ති ප්‍රකාරව තාක්ෂණික කමිටු පත් කිරීම සිදු කරනු ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2010 අංක 12 දරන ජාතික ශ්‍රම | පුස්තකාල සහ තොරතුරු සැපයීමේ සේවා පිහිටුවීම හා | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් 2023 වර්ෂයේ සිට භාණ්ඩාගාරය | පනතේ විධිවිධාන |

| | | | | |
|---|---|---|---|---|
| | අධ්‍යයන පනත 3 (ඇ) උපවගන්තිය | ඒවා නඩත්තු කිරීම ආයතනයේ එක් ප්‍රධාන අරමුණක් වුවත් 2024 මාර්තු 31 දින දක්වා එවැනි තොරතුරු සැපයීමේ සේවාවන් ක්‍රියාත්මක කර නොතිබුණි. | වෙතින් කිසිදු ප්‍රතිපාදනයක් ලබා ගැනීම සිදු නොකරයි. එබැවින්, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් උපයන ආදායමින් පුස්තකාලයක් ස්ථාපනය කිරීමේ කටයුතු ඉදිරියේ දී සිදු කරනු ලබයි. තවද වෙබ් අඩවියේ වෙනම පිටුවක් සකස් කර ඒ හරහා විද්‍යුත් ප්‍රකාශන ලබා දීමට කටයුතු යොදමින් පවතී. විද්‍යුත් ප්‍රකාශන ඇතුළත් වෙබ් පිටුවේ සැකසීම් ආරම්භ කර ඇති බව. | ප්‍රකාරව අරමුණු ඉටුකර ගැනීම කල යුතුය. |
| (ඈ) | 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන පනත 3 (ඉ) වගන්තිය | සමාන අරමුණු සහිත ජාතික හා විදේශීය ආයතන සංවිධාන සංගම් සහ සමිති සමඟ සමීප සහයෝගීතාවයෙන් කටයුතු කිරීම සිදුකල යුතු වුවද, එවැනි ආයතන සංවිධාන සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ආයතනය විසින් ගෙන නොතිබුණි. | ඉන්දියාවේ V V Giri National Labour Institute සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට 2008 වර්ෂයේ දී කටයුතු කළ අතර 2008 සිට 2016 දක්වා එය ක්‍රියාත්මක වුණි. ඉන් අනතුරුව 2020 වර්ෂයේ දී මෙය නැවත ක්‍රියාත්මක කිරීමට උත්සහ දැරූ නමුත් විවිධ හේතු නිසා එය සිදු නොවූ අතර ඉන්දියාවේ V V Giri National Labour Institute සමඟ අවබෝධතා ගිවිසුමක් ඉදිරියේ දී අත්සන් කෙරේ. එම අවබෝධතා ගිවිසුම නිරීක්ෂණ සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඉන් අනතුරුව කොරියාවේ හා ජපානයේ ශ්‍රම අධ්‍යයනය සම්බන්ධ ආයතන සමඟ ද සහයෝගීතාවයක් ඇති කර ගැනීමට ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙන් සහයෝගය ලබා ගැනීමට අපේක්ෂා කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඉ) | 2023 දෙසැම්බර් 11 දිනැති අංක 04/2023 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය | 2023 වර්ෂයේදී කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසාද දීමනා / දිරිදීමනා ගෙවීමට පෙර 2022 වර්ෂයේ ලාභයෙන් සියයට 30 ක මුදලක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කල යුතු වුවද, එසේ සිදුකිරීමෙන් තොරව ප්‍රසාද දීමනා වශයෙන් රු.325,000 ක් ගෙවා තිබූ අතර භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු රු.2,315,712 ක මුදල ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි. | 2023 වර්ෂය සඳහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු රු.2,315,712.00 මුදල ගෙවීමට අවශ්‍යය කටයුතු සූදානම් කර ඇති අතර අදාල ගෙවීම් කළ යුතු බැංකු ගිණුම් පිළිබඳ සනාත කර ගැනීම සඳහා මහා භාන්ඩාගාරය වෙත දැණුම් දී ඇති අතර කඩිනමින් ගෙවීම් කිරීමට කටයුතු කරනු ඇත. 2023 වාර්ෂික ගිණුම් යටතේ ඒ බව දක්වා ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,095,653 අතිරික්තයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.18,874,140 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,778,487 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වැඩසටහන් පැවැත්වීම් හා අනෙකුත් මෙහෙයුම් වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාගෝපදේශ සංග්‍රහය -2006 ප්‍රකාරව විධිමත් ඇස්තමේන්තු සකස් කර පරීක්ෂාවන් සිදුකිරීමකින් තොරව, අලුත්වැඩියාවන් සිදුකරන ලද වායුසමීකරණ යන්ත්‍රවලට අදාල විස්තර පවත්වා ගැනීමකින් තොරව හා අලුත්වැඩියාව නිසි පරිදි ඉටුවී තිබේද යන්න සහතික වීමකින් තොරව 2023 වර්ෂයේ අවස්ථා 07 කදී වායුසමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව සඳහා රු.1,096,250 ක් වැයකර තිබුණි.<br>නව වායුසමීකරණ අලුත්වැඩියාව සඳහා තෝරාගත් සැපයුම්කරු හැර ඉතිරි අයවලුන්ගේ මිල ගණන් ව්‍යාජ ලෙස සකසා ඉදිරිපත් කර තිබූ බව අනාවරණය වූ අතර සියලු උපාංග යොදා රු.481,825 ක් වැය කර අලුත්වැඩියා කරන ලද වායුසමීකරණ යන්ත්‍ර දෙකක් නැවත රු.91,075 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණද අදාල යන්ත්‍ර අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | අලුත්වැඩියාව නිවැරදි බව සහතික කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. එය NILS/AD/03/21/03 (PRO) ගොනුවේ ගොනු ගත කර ඇත. ඉදිරියේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇරඹීමට පෙර නිසි පරිදි ප්‍රසම්පාදන ලියවිලි සකසමින් කටයුතු නිසි පරිදි සිදු කරන බව දන්වා සිටින අතර මෙම වායු සමීකරණ යන්ත්‍ර නඩත්තු කිරීම ආයතනයේ හදිසි අවශ්‍යතාවය මත සිදු කිරීමට සිදු වූ බවද එම වර්ෂය තුළ ආයතනය වෙත විශාල වැය බරක් දරමින් නව යන්ත්‍ර මිලදී ගැනීමට හැකියාවක් නොවූ බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2021/2022 වර්ෂයන්හි වාර්ෂික වාර්තා පිටපත් 25 ක් මුද්‍රණයට හා මෘදු පිටපත් 6 ක් සඳහා රු.522,930 ක් වැය කර තිබූ අතර, මුද්‍රණ කාර්යය සිදු කිරීමේදී Offset ක්‍රමයට සිදුකිරීමේ එකඟතාවය මත ඇනවුම් භාරදී තිබුණද, එකී ක්‍රමවේදයෙන් බැහැරව Digital ක්‍රමයට මුද්‍රණය කරන ලද මුද්‍රිත පිටපත් සඳහා ගෙවා තිබූ අතර, 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ පිටකවරයද නිසි ප්‍රමිතියෙන් තොර බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී සියලුම මුද්‍රණ කටයුතු නියමිත ප්‍රමිතියට සිදු කර ඇත්ද යන්න තහවුරු කර ගැනීමෙන් පසු ගෙවීම් කිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදනයන් කාර්යක්ෂම ලෙස සිදුකල යුතුය. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනය ස්ථාපිත කිරීමේ අරමුණ ඉටුකර ගැනීම සඳහා 2020 ජූලි මාසයේදී පර්යේෂණ ප්‍රකාශන හා ව්‍යාපෘති අංශයක් ස්ථාපිත කර තිබුණද, විගණිත දින දක්වා අදාල අංශයට විධිමත් ලෙස නිලධාරියකු අනුයුක්ත කර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට එය අහිතකර ලෙස බලපා තිබුණි. | ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරි තනතුරට බඳවා ගැනීම් කටයුතු සඳහා ඇබෑර්තු නිවේදනය සකස් කර අමාත්‍යාංශ ලේකම්තුමාගෙන් අනුමැතිය ලබාගෙන ඇති අතර කඩිනමින් එය කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ, කම්කරු දෙපාර්තමේන්තුවේ හා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන වෙබ් අඩවි වල පළ කිරීමට නියමිත අතර ඉන් අනතුරුව සුදුසු නිලධාරියෙක් තෝරාගෙන එම තනතුර සඳහා බඳවා ගැනීමට නියමිත බව. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනයේ අනුමත කාර්යය මණ්ඩලය තුල අභ්‍යන්තර විගණක තනතුරක් පැවතියද අදාල රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් අදාල තනතුර පිරවීමට කටයුතු කර නොතිබූ අතර, අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණි. | ආයතනයේ නිලධාරින් බඳවා ගැනිම ආයතනයේ අවශ්‍යතාවය මත පමණක් සිදු කරනු ලබන අතර අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් පරිදි අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනය මගින් සිදු කෙරේ. එබැවින් අභ්‍යන්තර විගණන කාර්‍යභාරය නිසි ලෙස ඉටුවන බව. | අභ්‍යන්තර විගණනය විධිමත් පරිදි සිදුකල යුතුය. |

## 4.2 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2001 දරන පොදු ව්‍යාපාර සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 (h) ප්‍රකාරව විගණන කමිටුව මාස 03 කට වරක් රැස්වී එහි වාර්තා නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතු වුවද, 2023 වර්ෂයේදී විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | පාලක මණ්ඩලය නිසි ලෙස පත්වී නොතිබීම හේතුවෙන් 2023 වර්ෂයේ දී විගණන කමිටුව රැස්වීම පැවැත් වීමට නොහැකි වූ අතර, 2024 වර්ෂය සිට පලමු කාර්තු රැස්වීම දැනටමත් (2024/01/10) පවත්වා ඇති අතර දෙවෙන කාර්තුව සඳහා වූ විගණන කමිටු රැස්විම 2024/05/10 දින පැවැත්විමට දින නියම කර ඇති බව. | භාණ්ඩාගාර මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුය. |